# Philosophy of life
# ජීවන දර්ශනය

A boat docked in a tiny Mexican fishing village. A tourist complimented the local fishermen on the quality and the size of their fish and asked how long it took them to catch those fish.

" Not very long." they answered in unison.

"Why didn't you stay out longer and catch more? "

The fishermen explained that their small catches were sufficient to meet their needs and those of their families.

"But what do you do with the rest of your time?"

"We sleep late, fish a little, play with our children, and take siestas with our wives. In the evenings, we go into the village to see our friends, have a few drinks, play the guitar, and sing a few songs. We have a full life."

The tourist interrupted,
"I have an MBA from Harvard. I will tell you what it is. It's a Master Degree in Business Administration. So I can help you! You should start by fishing longer every day. You can then sell the extra fish you catch. With the extra revenue, you can buy a bigger boat."

"And after that?" asked fishermen.

" With the extra money the larger boat will bring, you can buy a second one and a third one and so on until you have an entire fleet of trawlers. Instead of selling your fish to a middle man, you can then negotiate directly with the processing plants and maybe even open your own plant. You can then leave this little village and move to Mexico City, LosAngeles, or even New York City !

From there you can direct your huge new enterprise."

"How long would that take?" asked fishermen in unison.

"Twenty, perhaps twenty-five years." replied the tourist.

"And after that?"

"Afterwards ? Well my friend, that's when it gets really interesting, " answered the tourist, laughing.

When your business gets really big, you can start buying and selling stocks and make millions!"

"Millions? Really? And after that?" asked the fishermen.

"After that you'll be able to retire, live in a tiny village near the coast, sleep late, play with your children, catch a few fish, take a siesta with your wife and spend your evenings drinking and enjoying your friends."

"With all due respect sir, but that's exactly what we are doing now. So what's the point wasting twenty-five years?" asked the Mexicans.

***And the moral of the story is: Know where you're going in life.... you may already be there !!***

♦ **F. J. Silva**
**Netherlands**



මෙක්සිකෝවේ ධීවරයින් වෙසෙන වෙරළබඩ කුඩා ගමකට සංචාරකයෙක් බෝට්ටුවකින් පැමිණියේය. අවට ඇවිද විසිතුරු බලා ඔහු එහි ධීවරයින් පිරිසක් සමග කතාවට වැටුණේය. ඒ මිනිසුන් අල්ලා ගෙනැවිත් තිබූ මාළුකූරියන් දැක ඒ මාළු හොඳ මාළු වර්ග බව කියා එය අල්ලන්නට ඔවුන්ට කොපමණ වේලාවක් ගියේදැයි සංචාරකයා ඇසී ය.

" නෑ.... එච්චර වෙලාවක් ගියේ නෑ..." මාළුකාරයෝ එක හඬින් පිළිතුරු දුන්හ. " මූදට ගියා... ටක්ගාලා මේ ටික අල්ල ගත්තා.... අපි ආපහු ආවා...."

"ඇයි ඉතින් තමුසෙලා මූදෙ තව වෙලා ඉඳලා... තව මාළු අල්ලන් එන්නෙ නැත්තෙ..? " සංචාරකයා ඇසීය.

ඊට ධීවරයින් පිළිතුරු දුන්නේ තමන් ඇල්ලූ සුළු මාළු ප්‍රමාණය තමන්ගේ සහ තම පවුලේ යැපීමට හොඳටම ප්‍රමාණවත් වන බවත් තව අවශ්‍ය නැති බවත්ය.

" දවසෙ ඉතිරි කාලෙ මොකද කරන්නෙ?"

" සාමාන්‍යයෙන් අපි දවල් වෙනකල් නිදා ගන්නවා... නැගිටලා ගිහිං මාළු ටිකක් අල්ලගෙන එනවා... ඇවිත් දරුවොත් එක්ක සෙල්ලම් කරනවා... දවල්ට කාලා අපේ ගෑණුත් එක්ක හොඳ නින්දක් ගහනවා... හවස ගමේ ක්ලබ් එකට යනවා... යාළුවොත් එක්ක බොනවා.... ඒපාර ගිටාර් එක ගගහ සිංදුවක් දෙකක් කියනවා... ඔහොමයි දවස ගෙවෙන්නෙ.... ඕක තමයි අපේ ජීවිතේ.... හොඳ නැද්ද...? "

" ඔයිට වඩා හොඳ ක්‍රමේකට තමුසෙලට ජීවිතේ හදාගන්න පුළුවන්...." සංචාරකයා කීය. " මට හාවර්ඩ් විශ්වවිද්‍යාලෙ ව්‍යාපාරික උපාධියක් තියනවා... මම කියන දේ අහනවලා.... මූදට ගිහිං මාළු අල්ලන්න වැඩි වෙලාවක් ගත කරනවා.... එතකොට ලොකු මාළු ගොඩක් ලැබෙයි.... ඒවා වික්කම සල්ලිත් ගොඩක් ලැබෙයි.... ඒකෙන් දැනට වඩා ලොකු බෝට්ටුවක් ගන්නවා.... තව මාළු අල්ලනවා.... ඒ මුදල් වලින් තව බෝට්ටු පේලියක්ම ගන්නවා.... ඒ අල්ලන මාළු පිටරටටත් යවන්න පුළුවන්.... එත කොට ඒක ජාත්‍යන්තර බිස්නස් එකක් වෙනවා..... තව ව්‍යාපාර වලටත් සල්ලි ආයෝජනය කරනවා..... තමුන්ගෙ බැංකුවෙ ඩොලර් මිලියන් ගණනක් එකතු වේවි.....ඔන්න ඕකයි හරි ක්‍රමය....."

" මොනවා ඩොලර් මිලියන ගණනක්....? " මාළුකාරයෝ විෂ්මයෙන් ඇසූහ. " කොච්චර කල් යයිද...? "

" වැඩිකාලයක් නෑ..... තව අවුරුදු විසිපහකින් විතර....."

" ඊට පස්සෙ මොකද වෙන්නෙ ? " ධීවරයෝ ඇසූහ.

" ආන්න දැනුයි තමුසෙලට මං කියන දේ තේරුණේ.... ඊට පස්සෙ මහන්සි වෙන්න ඕන නෑ.... වැඩිය මාළු අල්ලන්න ඕන නෑ.... දවල් වෙනකල් නිදාගන්න පුළුවන්.... දරුවො එක්ක යාළුවො එක්ක විනෝද වෙන්න පුළුවන්.... හවසට හිතේ හැටියට බොන්න පුළුවන්.... ජීවිතේ එතකාට රිලැක්ස් එකේ ගෙවන්න පුළුවන්...."

" ඉතින් බුදු මහත්තෙයො ඕකට අවුරුදු විසිපහක් බලන් ඉන්න ඕනද....? අපි දැනුත් කරන්නෙ ඕකම නේ...." ධීවරයෝ කීහ.




# ශ්‍රීලංකාව ලෝක අර්බුදයක් නූලෙන් බේරාගත් හැටි!



The latest sat-mobile from Japan

අපේ ලංකාව දැන් කාලයක් තිස්සේ මුළු ලෝකෙම අවධානය යොමු වෙච්ච තැනක් වෙලා. දවස ගානෙම වගේ වෙන්නාවූ සිද්ධීන් සංකීර්ණයි. ඒවගේම අවුල් සහගතයි. තව විදියකින් කිව්වොත් බරපතලයි. බටහිර රටවල් කියන විදියට මේ ළඟදි ඉඳලා ලංකාවෙ නාහෙට අහන්නෙ නැති ඔළුව ඉදිමිච්ච ගතියක් ඇතිවෙලා. වෙනදා බටහිර රටවල නායකයො යමක් කිව්වම ටිකක් බෙල්ල නවලා ඇහුම්කන් දීපු ලංකාව, දැන් බටහිර කියන කිසි දෙයක් තඹේකට ගණන් ගන්නෙ නැති තත්වෙකට ඇවිල්ලා. දැන් බටහිරට ඕන ලංකාව අල්ලලා බිත්තියට තියලා ඇණ ගහන්න. එක්සත් ජාතීන්ගෙ ලේකම් බෑන් චූන්ට කියල තමයි ලංකාව දණගස්වන්න හදන්නෙ.

මේ දේවල් මෙහෙම වෙන අතරෙ කොළඹ අළුත්ම රූපරාමුව තමයි, දැනට යුදහමුදා අත්අඩංගුවෙ ඉන්න හිටපු ජෙනරාල් සරත් පොන්සේකා මහත්තෙයා ආහාර වර්ජන උපවාසයක් පටන් අරගෙන. හේතුව එයා ඉන්න රැඳවුම් කුටියෙ දීලා තියන සැප පහසුකම් මදිවීම සහ දීලා තිබුණු මොබයිල් දුර කථනය රජයෙන් ආපසු ගැනීම. පොන්සේකා මහත්තෙයගෙ නෝනා කියන විදියට, තමාගෙ සැමියා ඇමරිකාවෙ ඉන්න දූලා දෙන්නට පණවගේ ආදරෙයි. දැන් ඇමරිකාවට ටෙලිපෝන් කරන්න විදියක් නෑ දූවලට. ඒනිසා මහත්තෙයා හරි හිතේ අමාරුවෙන් ඉන්නෙ. මාරාන්තික උපවාසයක් පටන් ගත්තා ටෙලිපෝන් එක ආපහු දෙන්න කියලා.

පස්සෙ දැනගන්න ලැබුණු තොරතුරු අනුව ජෙනරාල්ට තියාගන්න දීලා තිබුණු ජංගම දුරකතනය සාමාන්‍ය එකක් නොවෙයි, සැටලයිට් හෙවත් චන්ද්‍රිකා දුරකතනයක්. ඒකෙන් ලෝකෙ ඕනම රටක ඕනම තැනකට පහසුවෙන් කතාකරන්න පුළුවන්. ඒවගේ පෝන් එකක් ප්‍රභාකරන්ටත් තිබුණා. ප්‍රභාකරන් නෝර්වේ එක්ක සහ ඇන්ටන් බාලා එක්ක සංවාදෙ යෙදුනෙ ඒකෙන්. ප්‍රභාකරන් නන්දිකඩාල් කළපුව ළඟ ඉඳන් කේපීට කතාකරලා,"මචෝ අපි හැමෝටම දැන් කෙළවෙලා තියෙන්නෙ, කොහොම හරි අපිව බේරගන පලයං" කියලා කිව්වාය කියන්නෙත් ඒ සැටලයිට් පෝන් එකෙන්. ජෙනරාල් හිර කාමරේ ඉඳගෙන දූලට කතාකරනවා නම්, එයාට පහසුවෙන්ම පුළුවන් බටහිර රටවලට තමන්ට අවශ්‍ය දෙයක් කියන්න. බටහිර රටවල් ඒවා රෙකෝඩ් කරගනීවි, ඊට පස්සෙ එක්සත් ජාතීන්ගෙ සංගමය ලංකාවට විරුද්ධව බොහොම අගේට යුධ චෝදනා ගෙනැත් ලංකාව වරදකාරයා කරාවි. දැන් සැරයක් හමුදාව පාවලා දීලා ඉන්න ජෙනරාල්ට ඉතුරු ටික කරන්න වැඩිකලක් යන්නෙ නැහැ සැටලයිට් පෝන් එක තියනවා නම්. මං හිතන්නෙ දීලා තිබුණු ඒ ටෙලිපෝන් එක රජය ආපහු ගත්ත හේතුව ඒකයි.

උපවාසයෙ තව හේතුවක් තියෙන්න පුළුවන්. ජෙනරාල්ට විරුද්ධව ඇති නඩුව ළඟදිම අහනවා. යුද අධිකරණයේදි වැරදි කාරයා වෙන්න පුළුවන්. උපවාසයක් කරලා ශරීරය දුර්වල වෙලා ඉන්න කෙනෙක් උසාවි ගෙනියන්නෙ නැහැ. ඒ නිසා නඩු ඇහීමත් ප්‍රමාද වෙනවා. මේ වගේ ඔපීනියන් කවුද දෙන්නෙ? සමහර විට ජේවීපී එක වෙන්න පුළුවන්. ජෙනරාල් ඇමරිකාවෙ ඉන්දැදීත් ජවිපෙ ටිල්වින් සිල්වගෙන් උපදෙස් ගත්තු බව කවුරුත් දන්නවා.

දැන් හියුමන් රයිට් කාරයො කියන විදියට හිරකාරයෙකුට මොබයිල් පෝන් එකක් පාවිච්චි කරන්න දෙන්නෙ නැති එක මහා අපරාධයක්. මානව අයිතිවාසිකම් පැහැර හැරීමක්. මොන මොබයිල් පෝන්ද? ලෝකෙ සමහර රටවල තවම හිරකාරයින්ට කන්න දෙන්නෙ බෙලෙක් පිඟානෙ. වතුර දෙන්නෙ බෙලෙක් ජෝග්ගුවෙ. ඇමරිකාව පවා අල්කයිඩා හිරකාරයින්ට සලකන මහා අමානුෂික විදිය ලෝකෙ හුඟ දෙනෙක් දන්නවා. මේ හියුමන් රයිට්කාරයො ඒවටත් හරිනම් කෑගහන්න එපැයි. නෑ උන්ට ඕන ලංකාවට පහර ගහන්න. මේ පොන්සේකාගෙ කේස් එක ඉස්සරහට ගත්තොත් ලෝකෙ හුඟක් හිරකාරයො සැටලයිට් පෝන් ඉල්ලලා උපවාසෙ කරාවි. අල්කයිඩා කාරයො කියාවි අපේ ලොක්ක බින්ලාඩන්ට කතාකරන්න අපට සැට්-පෝන් එකක් ඕන කියලා. මහා බ්‍රිතාන්‍යයේ හිරගෙවල් වල ඉන්න මුස්ලම් ත්‍රස්තවාදීනුත් සැටලයිට් පෝන් ඉල්ලලා මාරාන්තික උපවාස කරාවි. මගේ ලොකු සැකයක් තියනවා කොරියාවෙයි ජපානෙයි මේ පෝන් හදන සමාගම් මේ උද්ඝෝෂණ පිටිපස්සෙ ඉන්නවා කියලා. මේවා මෙහෙම වෙද්දි අපේ ලංකා රජය පොන් සේකට ආපහු පෝන් එක දුන්නා. හැබැයි කැල්ලක් ගලවගෙන. දැන් ජෙනරාල්ට පුළුවන් දූලට ඇමරිකාවට කතාකරන්න. හැබැයි වෙන කොහාටවත් ඒකෙන් කතකරන්න බෑ. ප්‍රශ්නෙ ඉවරයි!

♦ **වෙලේගෙදර රාළ London**

# වැලි ඇටයක් — නලින්ගේ නවතම ගී තැටිය

දිගු කලක් තිස්සේ ඕස්ට්‍රේලියාවේ වාසය කරන ප්‍රවීන, ජනප්‍රිය ගායකයෙකු හා සංගීතඥයෙකු වන නලින් ජයවර්ධනගේ නවතම ගීත 18 ක් අඩංගු සංයුක්ත ගී තැටිය දැන් නිකුත් වී තිබේ. එයට නම් තබා ඇතේ එහි මුල් ගීතය වන වැලි ඇටයක් යන නමිනි. මෙම ගී තැටියේ සියළුම ගී රචනාකරනු ලැබ ඇත්තේ දැනට ඇමරිකාවේ වෙසෙන ආචාර්ය වික්‍රම්ප්‍රිය පෙරේරා විසිනි. සංගීත අධ්‍යක්ෂණයෙන් සංගීත් වික්‍රමසිංහ, රොහාන් ජයවර්ධන, ආනන්ද වෛද්‍යසේකර, රුක්ෂාන් කරුණානායක, ජයාංග දැදිගම සහ සානුක වික්‍රමසිංහ දායක වන අතර යුග ගායනාවෙ- න් සන්තූරි වෛද්‍යසේකර, සංගීත් වික්‍රමසිංහ, ආනන්ද වෛද්‍යසේකර, නිජාමලී ජයවර්ධන සහ සඳුනි රශ්මිකා ද නලීන්ට සහාය වෙති.

දිවංගත ජනප්‍රිය ගායක එච්. ආර්. ජෝතිපාල කලා කරුවාණන් සිහිවීම සහ උපහාර පිණිස නලින් ජෝතිගේ ගීත තැටියක් සිය හඬින් ගිය වසරේ නිකුත් කළේය. එසේම පාට පාට හීනයක් යනුවෙන් තවත් සිය නවතම ගී රැගත් සංයුක්ත තැටියක් නලින් ළඟදී එළිදක්වා ඇත. ජනප්‍රිය සිංහල ජූක් බොක්ස් Sinhala Jukebox ජනප්‍රිය වෙබ් අඩවියෙන්ද මේ ගී තැටි ඔබට ශ්‍රවනය කළ හැකි ය.






# අබේවර්ධන බාලසූරිය මහතා රෝගාතුර වෙයි

ජනප්‍රිය එමෙන්ම ප්‍රවීන ගායක අබේවර්ධන බාලසූරිය මහතා රෝගාතුරව ඉතා අසාධ්‍ය තත්වයෙන් කොළඹ පුද්ගලික රෝහලක දැඩි සත්කාරක ඒකකයේ සිටින බව සැළවෙයි. උගුරේ හටගත් ආබාධයක් වැඩිදියුණුවීම නිසා මේ තත්වය ඇතිවී යයි ලංකාවෙන් දැන ගන්නට ලැබුණි. මේ පුවතින් මුළු මහත් කලා ලෝකයම අතිශයින් කම්පාවට පත්ව සිටී.

අබේ මුල් කාලයේ ගායනාකළ ආදරයෙන් මා හදවට එතෙන ලතා සහ රෑ පැල් රකින කුරහන් පැහෙනා හේනේ ආදී ගීත ශ්‍රීලංකාවේ අතිශය ලෙස ජනප්‍රිය වීය. සරල ගී මෙන්ම චිත්‍රපට ගී රැසක්ද ඔහු ගයා ඇත. නන්දන වින්දන ඔහු ලංකාවේ රූපවාහිනියට ගෙනා ජනප්‍රිය වැඩසටහනකි.